84)

24 FEB 1988
UNIVERSITY OF COLOMBO LIBRARY

# අධ්‍යාපනික සාධනය කෙරෙහි පාසැල් ක්‍රීඩාවල බලපෑම ප්‍රමාණය කිරීම පිණිස කෙරෙන අධ්‍යයනයක්.

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය
( M.Phil ) සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනය.

UCLIB
409286

කර්තෘ : චන්ද්‍රලතා වෙල්ගම
ශාස්ත්‍රවේදී ( B.A. ), අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන)

ලියාපදිංචි අංකය : 80/ M.Phil/72.

409286 CR

අධ්‍යාපන පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

1985.05.30

Class No.
Acc. No. 409286

UNIVERSITY OF COLOMBO LIBRARY SRI LANKA

CR

සංක්ෂේපයෙන් ........

පත පොතේ දැනුම පමණක් සම්පූර්ණ රටවැසියකු තනා ගැනීමට ප්‍රමාණවත් නොවේ. අධ්‍යාපන ක්‍රමයක් විසින් අපේක්ෂිත ශිෂ්‍යයන්ගේ කායික හා මානසික සමබරතාවය මැනවින් පවත්වාගෙන යාමටත්, ඉවසීම, නීතිරීති පිළිපැදීම, විනයගරුක බව වැනි යහපත් චරිත ලක්ෂණ වර්ධනය කිරීමටත් විවිධ කුශලතා ආකල්ප ඇති කිරීමටත් ක්‍රීඩා ඉවහල් වන බැවින් පාසැල් ක්‍රීඩා ශිෂ්‍ය සංවර්ධනය කෙරෙහි මෙන්ම ඔවුන්ගේ ජීවිත යහමගට යොමු කිරීමටද විශාල රුකුලක් වනබව පෙනේ. එසේම ළමයකු සමාජානුයෝගී කිරීමේ කාරකයක් ලෙසත්, බාල්‍යාපචාරය වැනි ළමා වර්ධනයට අහිතකර බැලෑම් නැති කරන අර්ථවත් සාධකයක් ලෙසත් ක්‍රීඩා විශාල මෙහෙයක් ඉටු කරයි. ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමට ක්‍රීඩාවෙන් ලැබෙන පිටුවහල අනුපමේය වුවද ඇතැම් දෙමාපියන් හා ගුරුවරුන් තුළ ක්‍රීඩා නිසා ඉගෙනීමට බාධා ඇතිවන බවත්, සිසුන් දුරාචාරයට හා දඩබ්බර කම්වලට පෙළඹීම හේතුකොටගෙන ඔවුන්ගේ අධ්‍යාපනික සාධනය දුර්වල වන බවත් මතයක් වශයෙන් පවතී. එබැවින් මෙම අධ්‍යයනය අරමුණු කොට පවතින්නේ ක්‍රීඩාව සැබැවින්ම ඉගෙනීමට බාධාවක් වේද? ඒ හේතුවෙන් සිසුන්ගේ අධ්‍යාපන සාධනය දුර්වල වේද, එසේම ක්‍රීඩාව පිළිබඳ ඇතැම් දෙමව්පියන් හා ගුරුවරුන් තුළ පවතින ක්‍රීඩා පිළිබඳ ප්‍රතිෂේධාත්මක මති මතාන්තර සත්‍යවේදැයි පිරික්සීමයි.

මේ නිබන්ධනයේ පළමුවන පරිච්ඡේදයෙන් නිබන්ධන මාතෘකාව පිළිබඳ හැඳින්වීමක් කර ඇති අතර මෙම පර්යේෂණයේ අරමුණු හා එහි වැදගත්කම පෙන්වා දී ඇත. දෙවන පරිච්ඡේදයේදී ක්‍රීඩාවේ විකාශනය ලංකාවේ පාසැල්වල ක්‍රීඩාවට හිමි ස්ථානය හා ක්‍රීඩාවත් අධ්‍යාපනයත් අතර පවතින සම්බන්ධතාවය පෙන්වන සාහිත්‍ය විමර්ශනය කර ඇත. තුන්වන පරිච්ඡේදයේ දක්වා ඇත්තේ විවිධ රටවල විධිමත් පාසැල් අධ්‍යාපනය තුළ ක්‍රීඩාවට හිමි ස්ථානය පිළිබඳ විස්තරයකි.

සිව්වන පරිච්ඡේදයේදී අධ්‍යයන ක්‍රම පිළිවෙත පැහැදිලි කර ඇති අතර සියයට ගණන් සහසම්බන්ධතා සංගුණකය විසෑලි විශ්ලේෂණය ආදී සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම උපයෝගී කරගනිමින් දත්ත විශ්ලේෂණය පස්වන පරිච්ඡේද-යේදී කර තිබේ. හයවන පරිච්ඡේදයේදී පර්යේෂණය තුළින් බැසගත් නිගමන හා කළයුතු යෝජනා ඉදිරිපත් කර ඇත.

අවසාන වශයෙන් උපග්‍රන්ථයෙහි දත්ත ලබාගැනීම සඳහා සකස් කරන ලද ප්‍රශ්නාවලී නියැදියට අයත් පාසැල්, ක්‍රීඩා විස්තර, ලකුණු විස්තර හා සම්මුඛ සාකච්ඡා ආශ්‍රිත ප්‍රශ්නාවලී හා ග්‍රන්ථාවලියද සඳහන් වේ.

-----